# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# උතුරු පළාත
## පළාත් මට්ටමේ අවසාන පොදු වාර පරීක්ෂණය -2014
**සිංහල භාෂාව හා සාහිත්‍යය**
**II කොටස**

ශ්‍රේණිය 11 | කාලය පැය 1යි

විභාග අංකය ......................................... | ලකුණු

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **කාලය පැය 02 යි. මෙම ප්‍රශ්නපත්‍රයට නියමිත ලකුණු 80 කි.**

---

**අංක I සිට X දක්වා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.**

1)

I. **(අ) විසර්ගය යෙදුනු අර්ථවත් පදයක් ලියන්න.**
**(ආ) අනුස්වාරය යෙදුනු අර්ථවත් පදයක් ලියන්න.**

II. **පහත සඳහන් කර්ම කාරක වාක්‍ය කර්තෘ කාරක වාක්‍යය ලෙස සකස්කර ලියන්න.**
**(අ) උසස් නිළධාරින් විසින් සේවකයෝ පුහුණු කරන ලදහ.**
**(ආ) ආධුනික ලේඛකයෝ විසින් භාෂාරීතිහු උල්ලංඝනය කෙරෙති.**

III. **පහත සඳහන් පදවල අක්ෂර වින්‍යාසය නිදොස්කර ලියන්න.**
**(අ) විද්‍යුත් පරිපථය**
**(ආ) දුරස්ත පාඨමාලාව**

IV. **පහත සඳහන් ප්‍රකාශවලට අදාළ ප්‍රස්ථාව පිරුළු ලියන්න.**
**(අ) පළිගැනීමට නොහැකි නිසා පිළිහැනීම.**
**(ආ) අනුන්ව රැවටීමට යෑමෙන් තමන්ම රැවටීම.**

V. **පහත සඳහන් පද විසන්ධි කර දක්වා ඒවා අයත්වන සන්ධි වර්ග ලියන්න.**
**(අ) පඬිතුමා**
**(ආ) පොල්ලත්ත**

VI. **පහත දැක්වෙන පදවල විරුද්ධාර්ථ පද ලියන්න.**
**(අ) උත්තීර්ණ**
**(ආ) ආධුනික**

VII. **සහ, සමග යනු පද සම්බන්ධ කිරීම සඳහා යොදන නිපාත පදයි. ඒ අනුව පහත එක් එක් වර්ගයට අයත් නිපාත පදය බැගින් ලියන්න.**
**(අ) සීමාව ඇඟවීමේ නිපාත.**
**(ආ) ප්‍රමාණාර්ථයේ නිපාත.**

VIII. **පහත පද අයත්වන සමාස වර්ග නම් කරන්න.**
**(අ) බෙහෙත් බඩු**
**(ආ) සුන්තුරු**

IX. **දුම්රිය මැදිරි තුළ හඳුන් කූරු විකුණා ජීවත් වූ ඔහු ගීත ගැයීම මගින් ද අමතර ආදායමක් උපයා ගත්තේය. ඉහත සඳහන් වාක්‍යයේ යෙදී ඇති**
**(අ) තද්ධිත පදයක් උපුටා දක්වන්න.**
**(ආ) කෘදන්ත පදයක් උපුටා දක්වන්න.**

X. **කමත් බසෙහි මුන්තෙට්ටුව හා ගඟුල බානවා යන විශේෂිත වචනවල සාමාන්‍ය ව්‍යාවහාර වචන ලියන්න.**

**(ලකුණු 20 යි)**

2) **පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩුවන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.**

**(අ) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමට ලොව සෑම රටක්ම බැඳී සිටියද ළමයින් මෙහෙකාර සේවයේ යෙදවීම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල පවතින ප්‍රබල සමාජ ගැටලුවකි. ළමා ශ්‍රමිකයන් මෙවැනි විවිධ අපයෝජන වලට ලක්වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් කඩවීම පිළිබඳ පුවත් නිතර වාර්තා වේ. එමෙන්ම ළමයින් පැහැර ගැනීම, ලිංගික අපයෝජනවලට ලක්කිරීම මෑත භාගයේ ඇසීමට ලැබුණු කණගාටුදායක පුවතකි. මේ ගැටලුව විසඳීමට ඵලදායි ක්‍රියාමාර්ග ගැනීම රජයේ වගකීමක් වේ.**

**(ලකුණු 25 යි)**

**(ආ)** **ශ්‍රී ලංකාව තුළ මහාමාර්ග පද්ධතියේ විශාල සංවර්ධනයක් මේ වන විට දැකිය හැකිය. රටෙහි ප්‍රවාහන පහසුකම්වල දියුණුව එම රටේ ආර්ථික සංවර්ධනයද වේගවත් කරයි. ඒ සමඟම අධිවේගි මාර්ග වල සහ අනෙකුත් සියළුම මාර්ග වල දිනෙන් දින ඉහළ යන මාර්ග අනතුරු නිසා මිය යන සංඛ්‍යාවද වැඩිවේ. එබැවින් මාර්ග අනතුරු අවමකර ගැනීම සඳහා කටයුතු කළ යුතු කාලය දැන් එළඹ ඇත.**

**(ලකුණු 25 යි)**

**(ඉ)** **අනාදිමත් කාලයක සිට රටක පැවතගෙන එන්නා වූ ජාතික හා ආගමික උත්සව මඟින් ඒ රටේ සංස්කෘතියේ වැදගත් පැතිකඩක් නිරූපණය කෙරෙයි. ශ්‍රී ලංකිකයන් අතර පැවැත්වෙන එම උත්සව වල දක්නට ලැබෙන සංස්කෘතිකමය වටිනාකමද ඉහළය. එහෙත් වර්තමානයේ ආගමික සිද්ධස්ථාන වල පවත්වන ආගමික උත්සව හුදු වාණිජ පරමාර්ථයෙන් පමණක් පැවැත්වෙන බව පෙනේ. ඒ නිසා සියළුම ආගමික උත්සව වාණිජ පරමාර්ථයෙන් තොරවිය යුතුව ඇත. පන්සල්, පල්ලිය, කෝවිල ආගම දහමට ගරුකරන ආදර්ශමත් ජීවිතයකට මඟ පෙන්වන කේන්ද්‍රස්ථානයක් විය යුතුව ඇත.**

**(ලකුණු 25 යි)**

**(ඊ)** **වර්තමාන ශ්‍රී ලංකිකයන්ගේ සමීපතම රූපවාහිනි වැඩසටහන බවට පත්ව ඇත්තේ ටෙලි නාට්‍යය. මේවායින් බහුතරයක් කලාත්මක බවින් හීන හරසුන් ඒවා බව විචාරකයෝ පවසති. එමෙන්ම වත්මනෙහි පරිගණක භාවිතය හා ජංගම දුරකථන භාවිතය ද දැඩි ලෙස ඉහළ ගොස් ඇත. මේ තාක්ෂණික උපකරණ භාවිතය නිසා සිදුවන සමාජ පරිහානිය සුලුපටු නොවේ. සාරධර්ම පිරිහීම, අපචාරවලට ඇබ්බැහිවීම වැනි ප්‍රවනතා අන්තර්ජාලය හරහා ගලාගෙන එන බව නොරහසකි. එබැවින් රූපවාහිනිය, පරිගණකය හා ජංගම දුරකථන සුභාවිතය සඳහාම යොදාගත යුතු කාලය උදා වී ඇත.**

**(ලකුණු 25 යි)**

3) **පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාවද සාරාංශය අග ලියන්න.**

**ලෝකයේ දක්නට ලැබෙන දාර්ශනික හා සාහිත්‍යමය වටිනා කමකින් යුත් පැරණිම ලේඛන වන වේදග්‍රන්ථ, රාමායනය, මහාභාරත පමණක් නොව ඉලියඩ් හා ඔඩිසි යන මහා කාව්‍ය පවා ලියන ලද්දේ ඒ ඒ භාෂාවන් හි ව්‍යාකරණ හදාරා ඒ නීති රීති අනුව නොවේ. ඒවා රචනා වූ කාලය වන විට භාෂාවේ පිළිබඳ එක්තරා සාම්ප්‍රදායික නීතී රීතී මාලාවක් ඒ උගතුන්ගේ සිත්වල අවිඥානිකව පවතින්නට ඇත. ඒසේම ඒවායින් පිට පැන ගිය අවස්ථාද තිබෙන්නට ඇත. භාෂාවක් පවතින්නේ සාම්ප්‍රදායික නීති රීතී මාලාවය අනුකූල වූ විටය. ඒ භාෂාවම දියුණු වන්නේ ඒ නීති රීති වලින් පිට පනින විටය. මෙය පරස්පර විරෝධි කියමනක් නොවේ. එකම මාර්ගයේ හැමදාම ගමන් කිරීමෙන් අලුත් දේවල් දැන කියා ගත නොහැකිය. යම් හෙයකින් මේ පිට පැනීම සීමාව ඉක්මවා ගියහොත් එවිට මංමුලා වීමට පවා ඉඩ තිබේ. ඇත්ත වශයෙන් ලොවට නව දැනුමක් ලබා දෙන නිර්මාණාත්මක ලේඛකයන් විසින් අද වුවද භාෂාව භාවිතා කළ යුත්තේ මේ අන්දමිනි. ගතානුගතික දැනීම හා අදහස් ඉදිරිපත් තරන ලේඛකයන්ට නම් සාම්ප්‍රදායික ව්‍යාකරණ නීති රීති හදාරා සිය සීමා සහිත දැනුම ඒ රාමුව ඇතුළත ඉදිරිපත් කළ හැකිය. අලුත් දෙයක් ලෙවෙට දෙන ලේඛකයා තුළ සම්ප්‍රදායික ව්‍යාකරණ ඥාණය ශික්ෂණයක් හැටියට චිත්ත චෛතසිකගතව පවතින නමුත් එයට ඔහුගේ නිදහස් ප්‍රකාශනය පාලනය කිරීමට ඉඩ නොතැබිය යුතුය. සිරගතවීම, වල්මත්වීම යන දෙකෙන්ම තොරව ඉදිරියට යා හැක්කේ ඒ කල්හිය.**

**(ලකුණු 10 යි)**

4) **පහත දැක්වෙන කවි පෙළ කියවා ඒ සමඟ ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**ලොල් ඉසි මද මාන ඈ කටු පඳුරු වැවී**
**වල් බිහි වී තිබෙන ලොව සැඩ සතුන් සෙවී**
**මුල් පිස මගේ පෑනම කොට රැගෙන අවි**
**මල් උයනක් කරමි බිගු නද පිරුණු කවි**

**දෙගුරුන් ගෙලෙහි එල්ලී සුරතල් පාන**
**දරුවන්ගෙන් පිරුණු කුස ගිනි නොම පේන**
**මිහියෙන් කිරෙන් උතුරන රටකට නූන**
**ලොවැසියන් ගෙන යන්න මම වෙමි සුර යාන**

සිනා නොසින් කොට නොරුවට අබූතයෙන්
පිනා විමන දොර නොපියා අහිතයෙන්
දනා පොරණ විසි නම් තොර කුසීතයෙන්
අනාගතය සරසම් එම අතීතයෙන්

I. කවි පෙළෙහි සඳහන් අන්දමට ලොව වල් බිහි වී ඇති කටු පඳුරු ලෙස කවියා දකින්නේ මොනවාද?
II. කවියා මෙලොව මල් උයනක් කිරීමට අවිය කර ගන්නේ කුමක්ද?
III. කවියා අපේක්ෂා කරන අනාගත ලෝකය ගැන කියැවෙන කවි පද දෙකක් උපුටා දක්වන්න.
IV. මෙහි දැක්වෙන ආකාරයට අතීත මුතුන් මිත්තන් තුළ පැවති යහපත් ලක්ෂණ දෙකක් ලියන්න.
V. "නොසිස්" "පොරණ" යන පද වල අර්ථ දක්වන්න.

(ලකුණු 2 බැගින් 10 කි)

5) පහත දැක්වෙන්නේ නාමල්වැව මධ්‍ය මහා විද්‍යාලය ආරම්භ කර 2014 .12.05 දිනට වසර සියයක් සම්පූර්ණ වීම නිමිත්තෙන් විද්‍යාල පරිශ්‍රයේදී පැවැත් වීමට නියමිත අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනය පිළිබඳව ආදි ශිෂ්‍ය සංගමයේ කමිටු සාමාජිකයන්ගේ රැස්වීමේ දී සාකච්ජා වූ කරුණු වලින් කොටසකි. එම තොරතුරු ඇසුරු කරගෙන මෙම ප්‍රදර්ශනය පිළිබඳව ගම්වාසීන් දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙළ කරන්න.

| | | |
|---|---|---|
| දිනය | - | 2014.12.05 |
| වේලාව | - | පෙ.ව 9.00 - ප.ව 7.00 |
| ස්ථානය | - | නාමල්වැව මධ්‍ය මහා විද්‍යාලය |
| ප්‍රදර්ශන කුටි | - | කෘෂි කාර්මික, ඓතිහාසික තොරතුරු, මාධ්‍ය අංශය, කාර්මික, යුධ උපකරණ |
| ප්‍රධානත්වය | - | පළාත් ආණ්ඩුකාරතුමා |
| සහභාගිත්වය | - | පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ඇතුළු ආරාධිත අමුත්තන් |
| මෙහෙයවීම | - | විද්‍යාලීය ආදි ශිෂ්‍ය සංගමය |

නැතහොත්

පහත සඳහන් වන්නේ ගිණුම් ලිපිකරුවන් බඳවා ගැනීම සඳහා මහරගම අංක 01 ලීලාරත්න සහ පුත්‍රයෝ පෞද්ගලික ආයතනය 2014.09.10 දින ලක්මිණි පුවත් පතේ පළකළ දැන්වීමකින් උපුටා ගත් කොටසකි.

**<u>ගිණුම් ලිපිකරුවන් බඳවා ගැනීම</u>**

අප ආයතනය විසින් ගිණුම් ලිපිකරුවන් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- වයස අවු: 18 -24 අතර වීම
- අ.පො.ස (ස.පෙ) සමත්ව තිබීම
- අදාළ ක්ෂේත්‍රය පිළිබඳව ඇති පළපුරුද්ද

මෙම තනතුර සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට රාගම, වැලිසර, ජයමාවත අංක 25 ස්ථානයේ වෙසෙන සුපුන් දිවාකරට අවශ්‍යව ඇත. ඔහු ඉහත සුදුසුකම් සපුරා ඇති අතර අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අමතර සුදුසුකමක්ද ඇති අයෙකි. එම තැනැත්තා ඔබ යැයි සිතා අදාළ ආයතනයට යැවීම සඳහා ජීව දත්ත සහිත අයදුම්පතක් සකස් කරන්න.

(ලකුණු 15 කි)

The National e-learning Portal for The General Education